# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1518 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 |
| දිනය<br>திகதி<br>Date | 05/12/2023<br>පැය 0950 | | |

# මාධ්‍ය නිවේදනය

## 01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්ගමුව පොලිස් ස්ථානය.

2023.12.04 වන දින දහවල් කාලයේ දී ගල්ගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගල්ගමුව පොලිස් වසමේ වෑගෙදර ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 59 ක් වන වෑගෙදර, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්ගමුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිකවැරටිය පොලිස් ස්ථානය.

2023.12.04 වන දින සවස් කාලයේ දී නිකවැරටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නිකවැරටිය පොලිස් වසමේ දිවුල්ලැගොඩ ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන දිවුල්ලැගොඩ, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නිකවැරටිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - අනුරාධපුර පොලිස් වසම.

2023.12.04 වන දින සවස් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර බුද්ධගයා මාවතේදී ගෙවල් 55 දෙස සිට රත්නායක විද්‍යාලය දෙසට පුද්ගලයෙකු පාපැදියකින් ගමන් කරමින් සිටියදී ඊට පිටුපසින් එම දිශාවටම ධාවනය වූ කාර් රථයක් පාපැදියේ පිටුපස ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල

ලැබූ පාපැදිකරු එම කාර් රථයෙන්ම රැගෙන ගොස් අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ 03 වන පියවර, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**